සලාතය මෙහෙයවන ඉමාම් යම් තත්ත්වයක සිටියදී ඔබ අතරින් කිසිවකු සලාතය සඳහා පැමිණි විට, සලාතය මෙහෙයවන ඉමාම් සිදු කරන දේ මෙන්ම ඔහු ද සිදු කළ යුතුය.

අලී ඉබ්නු අබූ තාලිබ් තුමා හා මුආද් ඉබ්නු ජබල් -රළියල්ලාහු අන්හුමා- විසින් වාර්තා
කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “සලාතය මෙහෙයවන ඉමාම් යම් තත්ත්වයක සිටියදී
ඔබ අතුරින් කිසිවකු සලාතය සඳහා පැමිණි විට, සලාතය මෙහෙයවන ඉමාම් සිදු කරන දේ මෙන්ම
ඔහු ද සිදු කළ යුතුය.“
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත]

සලාතය මෙහෙයවන ඉමාම් සිටගත් ඉරියව්වේ හෝ රුකූහි හෝ සුජූද්හි හෝ වාඩි වී හෝ සිටින තත්ත්වයක ඔබ අතරින් කිසිවකු සලාතය සඳහා පැමිණි විට, ඉමාම්වරයා කියාම් හෝ රුකූ හෝ ඒ හැර වෙනත් කවර ඉරියව්වක සිටියද එහි ඉමාම්ට අනුකූලව කටයුතු කරත්වා. පොදු ඇතැම් පොදු ජනයින් ක්රියා කරන්නාක් මෙන් ඉමාම් නැගී සිටින තෙක් බලාපොරොත්තුවෙන් නොසිටිය යුතුය.

http://sunnah.global/hadeeth/si/show/11310